

# ශ්‍රී ලංකාවේ සතරවැනි වැවිල්ල

# ග්ලිරිසීඩියා ?

**"පො ලොවේ ඇති හැම ගහක්ම බෙහෙතක්" යන්න පැරණී ගැමියන් අතරින් එන කියමනකි. එවැනි අදහස් දැනුදු ප්‍රකාශ කළ හැකිය. "සෑම ශාකයකින්ම මුදල් ඉපැයිය හැකියි" යන්න එවැන්නකි. ග්‍රාමීය ප්‍රදේශයක නම් මේ සඳහා ගෙවත්තේ පැළ ඉනි වැට පසු කිරීම අවශ්‍ය නොවේ.**

එය ග්ලිරිසීඩියා ශාකයයි. උද්භිද විද්‍යාත්මක නාමය එසේ වුවත් ලංකාවේ විවිධ ප්‍රදේශ අනුව වැටමාර, වැටහිරියා, මකුලත, ලාඩප්පා, ගිනිසීරියා ආදී නම් ව්‍යවහාර කෙරේ. ග්ලිරිසීඩියා ශාකයේ ජන්ම භූමිය ලෙස සැලකෙන්නේ මෙක්සිකෝවයි. ක්‍රි. ව. 1700 පමණ ග්ලිරිසීඩියා මෙරටට සංක්‍රමණය වී ඇත. 2005 වර්ෂයේ දී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ග්ලිරිසීඩියා සතරවන වැවිලි වගාව ලෙස නම් කරනු ලැබ ඇත.

ග්ලිරිසීඩියාවල විශේෂත්වයන් අතර විවිධ පාරිසරික තත්ත්වයන්ට, පලිබෝධකයන්ට සහ රෝගවලට ඔරොත්තුදීමේ හැකියාව ප්‍රධාන වේ. වැඩි වර්ෂාපතනයත් සාමාන්‍ය උෂ්ණත්වයත් තුළ වැඩීම යහපත් ය. වැළඳුනු රෝගයක් නම් මෙතෙක් වාර්තා වී නොමැත.

තේ, පොල්, රබර් මෙන් ග්ලිරිසීඩියා වගා සංවර්ධනය කරන්නේ නම් අවම පිරිවැයකින් සහ පහසුවෙන් ලක්වැසි කාහටත් ආර්ථික වාසි සලසා ගත හැකිය. අතරමැදියන්ට යට නොවී තම ඉපැයීම් තුමාට, තම ඉදිරිය සාර්ථක කර ගැනීමට ආයෝජනය කළ හැකිවීම ග්ලිරිසීඩියා හි ආවේණික තවත් ලක්ෂණයකි.

ග්ලිරිසීඩියා මඟින් ලද හැකි ප්‍රයෝජන භෞතිකව, රසායනිකව, පාරිසරිකව සහ සත්ත්ව ආහාර යනුවෙන් පැහැදිලිව වර්ග කළ හැකිය.

පාරිසරික වාසි ලෙස පසේ උෂ්ණත්වය අඩු කිරීම, පසට වැටෙන අධික හිරුඑළිය ආවරණය කිරීම, පසේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වැඩි කිරීම ආදිය ද, රසායනික වාසි ලෙස වායුගෝලීය නයිට්‍රජන් පසට එක් කිරීම, පස සරු කිරීම, පත්‍ර යුෂ පලිබෝධනාශක ලෙස යොදා ගැනීම ද දැක්විය හැකිය. එසේම, දඬු කැබලි ඉන්ධන ලෙස යොදා විදුලිය ජනනය, සෙවන ශාකයක් ලෙස, සත්ත්ව ආහාර වශයෙන්, පත්‍ර කාබනික පොහොර ලෙස, සෝදාපාලුව පාලනය කිරීම, සුළං බාධක ලෙස යන ක්‍රියාකාරිත්වයන් භෞතික වාසි අතර වෙයි. ග්ලිරිසීඩියා මෙතුවක් කල් පැවතුනේ අතුරු වගාවක් ලෙස ය. ගම්මිරිස් ආශ්‍රිතව වගා කළ ද මෙය බහුලව දැකගත හැක්කේ පොල් වගාව ආශ්‍රිතවය. කුරුණෑගල, පුත්තලම, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, කෑගල්ල, මහනුවර, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, ගම්පහ, කොළඹ යන පොල් වගා දිස්ත්‍රික්ක මෙහිලා ප්‍රමුඛය.

පොල් පැළ පිහිටි භූමි මෙන්ම අවුරුදු පහළොව ඉක්මවූ පොල් ඉඩම් ද ග්ලිරිසීඩියා වගාවට මනාව උචිත වන්නේ හිරුඑළිය පොළොවට හොඳින් පතනය වන නිසා ය. අවුරුදු 5 - 15 අතර වයසැති අඩි 26 26 පරතරයෙන් සිටු වූ පොල් ගස් ඇති ඉඩම්වල පොළොවට පතිතවන හිරුඑළිය අවම නිසාත් අවුරුදු හැට ඉක්මවූ පොල් ඉඩම් නැවත වගාවට ආසන්න නිසාත් ග්ලිරිසීඩියා සිටුවීම නොකළ යුතුය.

පොල් වීදියන් අතර ග්ලිරිසීඩියා පේළි දෙකක් සිටුවීම.

මෙහිදී පොල් සිටුවා ඇති පරතරය අඩි 26 26 (මීටර් 8 8) ලෙස සලකනු ලැබේ. පොල් වීදිය හරි මැදට වනසේ ග්ලිරිසීඩියා පේළි දෙකක් (පේළි අතර පරතරය අඩි හයක් සහ පේළියක ගස් දෙකක් අතර පරතරය අඩි තුනක් වන ලෙසට) සිටුවනු ලැබේ. මෙය වඩාත් ජනප්‍රිය හා පහසු ක්‍රමය ලෙස පොල් වගාකරුවන් ගේ පිළිගැනීමයි.



## තනි පේළි ක්‍රමය

මෙහිදී පොල් වීදියක ග්ලිරිසීඩියා එක් පේළියක් සිටුවන අතර ගස් දෙකක් අතර පරතරය අඩි තුනකි. (මීටරයකි) පොල් කැඩීම, ප්‍රවාහනය වැනි කටයුතු පහසුවෙන් කළ හැකි ය. එහෙත් අක්කරයක් තුළ ඇති ග්ලිරිසීඩියා ගස් ගණන බොහෝ සෙයින් අඩුවීම හා ලැබෙන කොළ හා දඬු ප්‍රමාණය අඩුවීම මෙම ක්‍රමයේ ප්‍රධාන අවාසි වේ.

## දෙපේළි හා තනි පේළි ක්‍රමය

ඉහත ක්‍රමවල සම්මිශ්‍රණයකි. එක් වීදියක ග්ලිරිසීඩියා පේළි දෙකක් වන අතර ඊට යාබද වීදියේ තනි පෙළකි. මෙහි ප්‍රධානම වාසිය වන්නේ පොල් කැඩීම හා ප්‍රවාහනය පහසු වීමයි.

## දෙපේළි ඒකාන්තර ක්‍රමය

මෙම ක්‍රමයේ දී පොල් වීදියක ග්ලිරිසීඩියා අඩි 63 (මීටර් 21) පරතරයට පේළි දෙකක් සිටුවන අතර (පළමු ක්‍රමය මෙන්) යාබද වීදියේ ග්ලිරිසීඩියා සිටුවන්නේ නැත. ඒ අනුව වීදියක් හැර වීදියක ග්ලිරිසීඩියා වගාව සිදුවේ.

ප්‍රධානතම වාසිය පොල් කැඩීමට හා ප්‍රවාහනයට බාධා නොවීමයි. විශාල පොල් වතුවලට මෙය වඩා යෝග්‍ය වන අතර අක්කරයක ඇති ග්ලිරිසීඩියා ගස් ගණන ප්‍රමාණවත් නොවීම අවාසියකි.

## ග්ලිරිසීඩියා තුන් පේළි ක්‍රමය

ග්ලිරිසීඩියා සිටුවීමට තෝරාගන්නා පොල් වීදියේ ග්ලිරිසීඩියා පේළි තුනකි. එම පේළි අතර පරතරය අඩි තුනක් වන අතර එක් එක් පේළියේ ග්ලිරිසීඩියා ගස් දෙකක් අතර ද පරතරය අඩි තුනකි. වීදි එකක් හැර එකක් වනසේ ග්ලිරිසීඩියා සිටුවීම තුන් පේළි ක්‍රමයේ ලක්ෂණයයි.

## ග්ලිරිසීඩියා තනි වගාවක් ලෙස

පේළියක ග්ලිරිසීඩියා ගස් දෙකක් අතර පරතරය අඩි 33 වන සේ ද පේළි දෙකක් අතර පරතරය අඩි තුනක් වන සේ ද සිටවිය යුතුය. නමුත් පේළි දෙළහකට වරක් අඩි දෙළහක පරතරයක් තැබිය යුතුය. ඒ ප්‍රවාහන පහසුව තකාය. මෙම සිටුවීමේදී හෙක්ටයාර් එකකට දඬු 8000 ක් පමණ සිටුවිය හැකිය. වගාවට වසර 6-7 ක් ගතවීමෙන් ග්ලිරිසීඩියා ගස් විශාල වීම නිසා එකිනෙක අතර තරගයක් ඇතිවී එමඟින් අස්වැන්න අඩු වන්නේනම් පෙළක් හැර පෙළක් කපා ඉවත් කළ යුතු ය. ඉහළ දඬු අස්වැන්නක් උදෙසා වගා කරන මෙම ක්‍රමය ඉදිරියේ දී ප්‍රචලිත වෙතැයි අපේක්ෂිත ය.

## ග්ලිරිසීඩියා බෝකිරීම හා පැළ ලබාගත හැකි විවිධ ක්‍රම

බීජ මඟින් පැළ ලබා ගැනීම

හොඳින් මෝරා වැඩුණු ග්ලිරිසීඩියා ගස්වල පෙබරවාරි, මාර්තු මාසවල රෝස පාට (ඉතා කලාතුරකින් සුදු පාට) මල් හට ගනී. මාර්තු මස වනවිට අඟල් 6-7 ක් දිගැති පැතලි කොළ පාට කරල් හටගත පසුව ලා කොළ, දුඹුරු පාටට හැරෙයි. එම කරල් කඩා දින 1-2 ක් සෙවණෙහි තබා කරල් පලා බීජ පහසුවෙන් ලබාගත හැකි ය. ලබාගත් බීජ තවාන් පාත්තියක පැළ කිරීම ද පොලිතින් මලුවල පැළ කිරීම ද කළ හැකිය. පොලිතින් මලුවල භාවිතා කරන තවාන් මිශ්‍රණය නම්...

මතු පිට පස් - කොටස් තුනයි
වැලි පස් - කොටස් එකයි
කොම්පෝස්ට් - කොටස් එකයි

පොලිතින් මලුවල ප්‍රමාණය
උස - සෙ.මී. 15-20
පළල - සෙ.මී. 6-12

ඉහත තවාන් මිශ්‍රණය පුරවන ලද පොලිතින් මලුවල බීජ දෙකක් පමණ අඟල් භාගයක් ගැඹුරින් තැන්පත් කළ යුතුය. ඉන්පසු පොලිතින් මලු සති දෙකක් පමණ තෙතමනය සුරැකෙන සේ තැබූ විට පැළ හට ගනී. මාස දෙකකින් පමණ එම පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට පත්වේ.

ක්ෂේත්‍රයේ දී පොලිතින් මලු ඉවත් කර පැළ සිටුවීම කළ යුතු ය. වැසි සහිත දේශගුණයක

නම් 80–90% ක් පමණ පැළවීම සාර්ථක ය.

## දඬු කැබලි මගින් පැළ

දඬු කැබලි මගින් පැළ ලබා ගැනීම සඳහා අඟල් 6–10 අතර දිගැති කැබලි ලබාගත යුතු ය. මුල් ඇදීම උත්තේජනය කෙරෙන ඉන්ඩෝල් ඇසිටික් අම්ලය වැනි හෝමෝන වර්ගයක් දණ්ඩේ මූලයට යෙදිය යුතු ය. පසුව පොලිතින් මලුවල බහා සෙවනැති ස්ථානයක තැබිය යුතුය. සති දෙක තුනකින් දඬු ලියැලූ පසු සිටුවීමට සුදුසු ය.

වඩාත් ජනප්‍රිය ක්‍රමය නම් දඬු කෙළින්ම ක්ෂේත්‍රයේ වගා කිරීම ය. අඟල් එකක් පමණ විෂ්කම්භය හා අඩි 3 1/2ක් පමණ වූ දඬු කැබලි ග්ලිරිසීඩියා ගස්වලින් කපාගත් සැනින් ක්ෂේත්‍රයේ සිටුවිය යුතුය. දණ්ඩේ පහළ කෙළවර ඇලයට කපා අඟල් 4–5 ක් ප්‍රමාණයක් පසට යට කළ යුතුය. මුල් ඇදීම හොඳින් සිදුවන්නේ එවිට ය. ක්ෂේත්‍රයේ කෙළින්ම සිටුවීමේ දී මෙන්ම පැළ කිරීමේ දී දඬුවල පොත්ත තැලීම හා වියළීම වැළැක්විය යුතු ය. තවද දඬු සිටුවීම උෂ්ණත්වය අඩු වර්ෂාව වැඩි ජූනි, ඔක්තෝබර්, නොවැම්බර් මාස වඩා සුදුසු ය.

බීජ තවාන් මගින්, පැළ කර සිටුවන්නේ නම් සෙ.මී. 20 20 20 ප්‍රමාණයේ වළවල් ද, දඬු සිටුවීමේ දී සෙ. මී. 10 10 15 ප්‍රමාණයේ වළවල් ද ප්‍රමාණවත් ය.

ග්ලිරිසීඩියා සිටුවීමේ දී යෙදිය යුතුවිශේෂ පොහොර මිශ්‍රණයක් නොමැති නමුත්, වළට සාන්ද්‍ර සුපර් පොස්ෆේට් ග්‍රෑම් පහක් පමණ යෙදීමෙන් මුල් ඇදීම ඉක්මන්කරයි. එමෙන්ම දඬු සිටුවීමේ දී දඬුවල ඉහළ කෙළවරේ තෙත මැටි සහිත පොලිතින් කවරයක් බැඳීමෙන් දණ්ඩේ ඉහළින් පැළවීම සිදුවන අතරම දඬු වියළීම ද අඩුකරයි.

ග්ලිරිසීඩියා පැළ අතර වල්පැළෑටි අධිකව වර්ධනය වී ඇත්නම්, ග්ලයිපොසේට් වල්නාශකය මි.ලී. 100 – 120 ක් ජලය ලීටර් 16 ක (ගැලුම් 4) දිය කර යෙදීම සුදුසු ය. මෙහිදී ග්ලිරිසීඩියා ගස්වල නොතැවරෙන ලෙස යෙදීම නිසා වගාවේ වර්ධනයට බාධා සිදු නොවේ.

ග්ලිරිසීඩියා ගස් අඩි 3 – 4 1/2 (මීටර් 1.0 සිට 1.5) උසින් වර්ධනය වූ කල අතු [illegible] කැපීමෙන් ගසේ වර්ධනය සීඝ්‍ර වේ. සිටුවා මාස 8 – 12 ගත වූ පසු ප්‍රථම අතු කැපීම සිදු කළ හැකි ය. මුල් වසරින් පසු නඩත්තුවක් අවශ්‍ය නොවේ.







දඬු දුඹුරු පැහැ වූ විට කපාගත හැකි ය. ග්ලිරිසීඩියා සිටුවා අවුරුදු දෙකක් ගතවූ කල මාස හයෙන් හයට කොළ පොහොර වශයෙන් ද අතු කැපීම සිදු කළ හැකි ය.

ග්ලිරිසීඩියා කොළ ඉතා හොඳ නයිට්‍රජන් පොහොරකි. එය නයිට්‍රජන් තිර කිරීම මගින් පසට කාබනික නයිට්‍රජන් ලබා දීමට සමත් වේ. ග්ලිරිසීඩියා කොළ හා නොමේරූ දඬුවල වියළි බරින් 2.5 – 3.0% දක්වා ප්‍රමාණයක් නයිට්‍රජන් අඩංගු වේ. තවද ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය වන බෝරෝන් තඹ, තුත්තනාගම් ආදිය ද ග්ලිරිසීඩියා කොළවල අන්තර්ගතය. මේ අනුව පොල් ගසකට රසායනික පොහොර හා ග්ලිරිසීඩියා කොළ යෙදීම පිළිබඳ සටහනක් පහත දක් වේ.

## ග්ලිරිසීඩියා අස්වැන්න ගසකින් වසරකට කිලෝ

| | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර | 6 වසර |
|---|---|---|---|---|---|---|
| **කොළ** | 2.0 | 2.5 | 3.6 | 6.0 | 8.0 | 8.0 |
| **දඬු** | 1.4 | 4.0 | 5.8 | 8.7 | 7.0 | 6.0 |

පොහොර වර්ගය පොල් පොහොර මිශ්‍රනය. රසායනික ලෙස යොදන විට. ගසකට, වසරකට, කිලෝ ග්ලිරිසීඩියා කිලෝ පනහක් සමග යොදන විට.

| | | |
|---|---|---|
| යූරියා | 0.80 | - |
| රොක්පොස්ෆේට් | 0.60 | 0.35 |
| මියුරියේට් ඔෆ් පොටෑස් | 1.60 | 1.00 |
| ඩොලමයිට් | 1.00 | 0.50 |

ග්ලිරිසීඩියා වගාව ප්‍රධාන වැවිලි වගාවක මට්ටමට ගෙන ඒමට නම් කළයුතු අත්‍යවශ්‍ය ම දෙය නම් විදුලි බල උත්පාදනය උදෙසා ගැසිෆයර් තාක්ෂණය (දරවලින් ඉන්ධන නිපදවිය හැකි එක් ක්‍රමයකි) ව්‍යාප්ත කිරීම බව මෙතුවක් ආ ග්ලිරිසීඩියා වගාවේ ගමන් මග දෙස බැලීමේ දී පැහැදිලිව පෙනී යයි.

2004 වසරේ සංඛ්‍යාලේඛන අනුව ගැසිෆයර් සඳහා වන ඉල්ලුමට සරිලන ග්ලිරිසීඩියා දඬු නිෂ්පාදනයක් වී නොමැත.

ග්ලැසිෆයර් යන්ත්‍ර ස්වභාවය අනුව දඬු සැපයීමේ දී දඬු කැබලි දිග අඟල් 4-6 (සෙ.මී. 10-15) අඩි තුන යන ප්‍රමාණයත් විය යුතු ය. පරිධිය අඟල් 2-3 (සෙ.මී. 5-8) වීම සෑහේ.

ග්ලිරිසීඩියා දඬු කැපීමේදී වර්ෂාව රහිතවීම, මෙන්ම දඬු සියල්ල එකවිට කැපීම කළ යුතුය. කැපූ දඬු දින 5-7 ක් ක්ෂේත්‍රයේ තබා කොළ හැලුනු පසු අලෙවි කිරීමට සුදුසු සේ පොලිතින් උරවල (පොලිසැක්) බහා මසක් පමණ තැබිය යුතුය. මන්දයත් තෙලූ දඬුවල තෙතමනය 20% ක් වීමට දින හතළිහක් පමණ ගත වේ. ඇසුරුම් කරන ලද ග්ලිරිසීඩියා දඬු කැබලි මාස දෙකක් පමණ පහසුවෙන් තබා ගත හැකිය. පොල් වගාවට හානි නොවනසේ ග්ලිරිසීඩියා වගාව පවත්වාගත යාමට නම් නියමිත ප්‍රමිතීන්ට අනුව වගාව සිදු කළ යුතු ය. සිටුවා වසර දෙකේ සිට අඩි තුනක් උසින් කප්පාදු කිරීම අනිවාර්ය ය. නමුත් දින හැටකට අධිකව නියගයක් පවතී නම් අතු කප්පාදුව කෙටි කාල පරාසයන් තුළ කළ යුතු ය. එවිට පොල් වගාවට ජල හිඟයක් සිදු නොවේ.

## ආදායම

අඟල් තුනට කපා වියළන ලද (තෙතමනය 20%) ග්ලිරිසීඩියා දඬු කැබලි කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 2.50 – 3.00 ක් මිල වේ.

ග්ලිරිසීඩියා උදෙසා රාජ්‍ය අනුග්‍රහය එනම් වගා සහනාධාර විවිධ උපකරණ ආනයනය සඳහා තීරු බදු සහන ආදිය ලැබෙන්නේ නම් මහා පරිමාණ වශයෙන් වගාවේ නියැලීමට ගොවියා නවතවත් උනන්දු වනු ඇත. පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් මෑතක සිට ලබාදෙන, අක්කරයකට රුපියල් තුන්දහසේ මූල්‍ය ආධාරය කලෙක සිට අත්‍යවශ්‍යව තිබුනකි.

ලංකාවේ සතරවන වැවිලි වගාව ග්ලිරිසීඩියා නම් එය තේ, පොල්, රබර් මෙන් නමක් ඇති ගහක් විය යුතුය. එය නවදුරටත් අතුරු වගාවක්ම පමණක් නොවිය යුතු ය.

❑

**සම්පත් දායකත්වය :-**
**පොල් පර්යේෂණායතනයේ ශෂ්‍ය විද්‍යා අංශ ප්‍රධානී ආචාර්ය ජයන්ත ගුණතිලක.**
**සටහන - පුබුදු කිත්සිරි**